ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# ඌව පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි සේවයේ

# I ශ්‍රේණියේ නිලධාරීන්ගේ III වන

## කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022

## ව්‍යාපෘති කළමනාකරණය

කාලය පැය 03 යි.

මුළු ලකුණු 100 යි.

1 හා 2 ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

---

01. “ලංලෝ” යකඩ නිෂ්පාදන සමාගම වෙළඳපොලේ ඉල්ලුමට සරිලන නව තාක්ෂණයෙන් යුත් නිෂ්පාදනයක් වෙළඳපොලට හඳුන්වා දීම සඳහා සිය අවධානය යොමු කරමින් සිටී. ඒ සඳහා දැනට සමාගම භාවිතා කරන පැරණි යන්ත්‍රය වෙනුවට අලුත් යන්ත්‍රයක් මිලදී ගැනීමට අපේක්ෂා කරයි. මෙම තාක්ෂණික සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ණය මුදල් ලෙස තම බැංකුකරුවාගෙන් සපයා ගැනීමට සමාගම අපේක්ෂා කරයි. කර්මාන්ත සංවර්ධනය සඳහා මූල්‍ය ආයතන හඳුන්වා දී ඇති ණය යෝජනා ක්‍රම සඳහා වාර්ෂිකව අය කරන පොලී ප්‍රතිශතය 15% කි.

ඉහත ආයෝජන වැඩසටහන හා සම්බන්ධ රැස් කරගත් තොරතුරු වලට අනුව යන්ත්‍රය ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමේ පිරිවැය හා ඒ අනුසාරයෙන් ඉදිරි වසර 10 තුල අත්කර ගත හැකි යැයි අපේක්ෂා කරන ප්‍රතිලාභ පහත දැක්වේ.

පිරිවැය

| | | |
|---|---|---|
| I. | යන්ත්‍රයේ මූලික පිරිවැය | රු. 600,000 |
| II. | ව්‍යාපාරික ස්ථානය කරා ප්‍රවාහනයට | රු. 40,000 |
| III. | ව්‍යාපාරික ස්ථානයේ එය සවි කිරීමට | රු. 60,000 |
| IV. | අතිරේකව යන වියදම් | රු. 20,000 |

ප්‍රතිලාභ

| | | |
|---|---|---|
| I. | පළමු වර්ෂයේ දී | රු. 120,000 |
| II. | දෙවන වසරේ සිට ඉදිරියට | රු. 180,000 |

යන්ත්‍රය ආර්ථික වශයෙන් ප්‍රයෝජනය ගත හැකි කාලය වසර 10 ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇති අතර, වසර 10 කට පසු එහි සුන්බුන් අගය රු. 120,000 පමණ වෙතැයි අපේක්ෂා කරයි.

සමාගම සරල මාර්ග ක්ෂය ක්‍රමය යටතේ වත්කම් ක්ෂය කරයි. වාර්ෂිකව උපයන ශුද්ධ ප්‍රතිලාභ වලින් 50% සමාගම් බදු වශයෙන් රජයට ගෙවිය යුතුයි. ( 6%, 10%, 15% වට්ටම් ප්‍රතිශතය යටතේ ශුද්ධ වර්තමාන අගය හා සමුච්චිත ශුද්ධ වර්තමාන අගය ඇමුණුම් අංක 1වගුවේ දැක්වේ. )

I. සමාගමේ මූල්‍ය අංශයේ ව්‍යාපෘති කළමනාකරු වශයෙන් මෙම ආයෝජන ව්‍යාපෘතියේ යෝග්‍යතාවය ඇගයීමට ඔබට පැවරෙන්නේ යැයි සිතන්න. මේ සඳහා වඩාත් යෝග්‍ය සුදුසු ශිල්පීය ක්‍රම 4 ක් හඳුන්වා, ඒවා උපයෝගී කර ගෙන ආයෝජනයේ යෝග්‍යතාවය පිළිබඳ ඇගයීමක් කර කළමනාකාරීත්වයට ඉදිරිපත් කිරීමට වාර්තාවක් පිළියෙල කරන්න.

II. අභ්‍යන්තරික ඉපයුම් අනුපාතිකය ( IRR ) ව්‍යාපෘති ඇගයීම් ශිල්පීය ක්‍රමයක් ලෙස යොදා ගැනීමේ වැදගත්කම අගය කරන්න.

( ලකුණු 30 )

02. මොණරාගල දිස්ත්‍රික්කයේ බඩඉරිඟු නිෂ්පාදනය ඉහළ නැංවීමට හා ගොවීන්ගේ ජීවන මට්ටම උසස් තැනකට ගෙන ඒමට ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. යෝජිත ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. මිලියන 500 ක් වන අතර ඒ සඳහා විදේශ ආධාර ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ අපේක්ෂිත කාලය වසර 2 ක් වන අතර යෝජිත ව්‍යාපෘතියේ ඉලක්කයන් වනුයේ,

- දිස්ත්‍රික්කයේ බඩඉරිඟු නිෂ්පාදනය 65% කින් වැඩි කිරීම.
- හෙක්ටයාරයකට ලැබෙන අස්වැන්න මෙ.ටො. 6.5 – 10 දක්වා වර්ධනය කිරීම.
- බඩඉරිඟු ගොවීන්ගේ ආදායම 75% කින් ඉහළ නැංවීම.

ව්‍යාපෘතිය සඳහා වෙන්කරනු ලබන ප්‍රතිපාදන පහත සඳහන් අංශ වලට යෙදවීමට අපේක්ෂා කෙරේ.

- වැව් තුනක් පුනරුත්ථාපනය කර වාරි ඇල මාර්ග කි.මී. 200 ක් ඉදිකිරීම මඟින් හෙක්ටයාර 25,000 කට ජලය සැපයීම.
- බඩඉරිඟු ගොවීන් 1500 ක් හා කෘෂි උපදේශක නිලධාරීන් 75 ක් පුහුණු කිරීම.
- ගොවීන් 15,000 ක් සඳහා බඩඉරිඟු බීජ සැපයීම.
- ගොවීන් 30,000 කට පමණ වගා ණය ලබා දීම.

I. මෙම ව්‍යාපෘතියේ පහත දැක්වෙන දෑ නිගමනය කරන්න.

(අ) දිගු කාලීන ප්‍රතිඵල ( Impact )

(ආ) ක්ෂණික ප්‍රතිඵල ( Outcome )

(ඇ) අපේක්ෂිත නිමවුම ( Expected Output )

(ඇ) ක්‍රියාකාරකම් ( Activities )

II. ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික හා සමාජීය පරිසරය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ එමඟින් ඉටුකර ගැනීමට අපේක්ෂිත සංවර්ධන අරමුණු සඳහා බලපෑ හැකි බාහිර අභියෝග, තර්ජන හා ගැටලු කවරේද?

III. මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය හා ප්‍රතිඵල ක්‍රමානුකූලව හා තර්කානුකූලව ඇගයීම සඳහා තර්කරාමු විශ්ලේෂණයක් ( Logical Framwork Analysis ) සිදු කරන්න. ඒ සඳහා ඇමුණුම් 1 හි සඳහන් නියාසය ( Metrix ) උපයෝගී කර ගන්න.

( ලකුණු 30 )

03. ව්‍යාපෘති චක්‍රයේ අවස්ථාවන් හඳුන්වා දෙමින් ඒවා අතර පවතින අන්තර් සම්බන්ධතාවය පැහැදිලි කර සාර්ථක ව්‍යාපෘතියක් නිර්මාණය කිරීම සඳහා අන්තර් සම්බන්ධතාවන් කොතෙක් දුරට වැදගත් වන්නේද යන්න සාකච්ඡා කරන්න.

( ලකුණු 20 )

04. "ව්‍යාපෘතියක් පිළියෙල කිරීම ක්‍රමානුකූලව සහ විස්තරාත්මකව සිදු කිරීම ඉතා වැදගත් වේ."

I. ව්‍යාපෘතියක් සකස් කිරීමට ප්‍රථම අවධානය යොමු කළ යුතු මූලික කරුණු විග්‍රහ කරන්න.

II. ව්‍යාපෘති යෝජනාවක අඩංගු විය යුතු කරුණු විග්‍රහ කරන්න.

( ලකුණු 20 )

05. I. "සංවර්ධනය වෙමින් පවත්නා රටවල මිල යාන්ත්‍රණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවීම නිසාත්, මිල යාන්ත්‍රණයේ පවත්නා විකෘතිතාවයන් නිසාත් ව්‍යාපෘති ඇගයීමේදී වෙළඳපල පවත්නා මිල වෙනුවට ඡායා මිල යොදාගනු ලැබේ." මේ පිළිබඳ ඔබේ අදහස් විග්‍රහ කරන්න.

II. විදේශ විනිමයෙහි ඡායා මිල ගණනය කරන ආකාරය විග්‍රහ කරන්න.

( ලකුණු 20 )

06. “රාජ්‍ය ව්‍යාපෘති ඇගයීමේ දී පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය කරයි.එහිදී සුභසාධක පදනම යටතේ සලකා බැලිය යුතු පොදුවේ පිළිගත් සුභසාධක නිර්ණායකයන් නොමැති වීම පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂකයා මුහුණ දෙන බලවත්ම අභියෝගයයි.” විවිධ සුභසාධක නිර්ණායකයන් ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය විග්‍රහ කරන්න.

( ලකුණු 20 )

ඇමුණුම 01

## වට්ටම් ප්‍රතිශත යටතේ ශුද්ධ වර්තමාන අගයන්

| වර්ෂය | ශුද්ධ වර්තමාන අගය | | | සමුච්චිත ශුද්ධ වර්තමාන අගය | | |
|---|---|---|---|---|---|---|
| | 6% | 10% | 15% | 6% | 10% | 15% |
| 1 | 0.943 | 0.909 | 0.870 | 0.943 | 0.909 | 0.870 |
| 2 | 0.890 | 0.826 | 0.756 | 1.833 | 1.736 | 1.626 |
| 3 | 0.840 | 0.751 | 0.658 | 2.673 | 2.487 | 2.283 |
| 4 | 0.792 | 0.683 | 0.572 | 3.465 | 3.170 | 2.855 |
| 5 | 0.747 | 0.621 | 0.497 | 4.212 | 3.791 | 3.352 |
| 6 | 0.705 | 0.564 | 0.432 | 4.917 | 4.355 | 3.784 |
| 7 | 0.665 | 0.513 | 0.376 | 5.582 | 4.868 | 4.160 |
| 8 | 0.627 | 0.467 | 0.327 | 6.210 | 5.335 | 4.487 |
| 9 | 0.592 | 0.424 | 0.284 | 6.802 | 5.759 | 4.772 |
| 10 | 0.558 | 0.386 | 0.247 | 7.360 | 6.145 | 5.019 |
| 11 | 0.527 | 0.350 | 0.215 | 7.887 | 6.495 | 5.234 |
| 12 | 0.497 | 0.319 | 0.187 | 8.384 | 6.814 | 5.421 |

ඇමුණුම් 02

මොණරාගල දිස්ත්‍රික්කයේ බඩඉරිඟු නිෂ්පාදනය ඉහල නැංවීමේ හා ගොවීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ ව්‍යාපෘතිය

තර්ක රාමු විශ්ලේෂණය ( Logical Framwork Analysis )

| | සත්‍යාපන්ෂණ කළ හැකි දර්ශක ( Verifiable Indicators ) | සත්‍යාපන්ෂණ උපාය ( Means Of Verification ) | බාහිර සාධක ( External Factors ) |
|---|---|---|---|
| (i) දිගු කාලීන ප්‍රතිඵල ( Impacts )<br>(අ)<br>(ආ) | | | |
| (ii) ක්ෂණික ඵල ( Outcomes )<br>(අ)<br>(ආ) | | | |
| (iii) අපේක්ෂිත නිමවුම් ( Outputs )<br>(අ)<br>(ආ)<br>(ඉ)<br>(ඊ)<br>(උ) | | | |
| (iv) ක්‍රියාකාරකම් ( Activities )<br>(අ)<br>(ආ)<br>(ඉ)<br>(ඊ)<br>(උ) | | | |